# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/43 - 2015 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2015.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 987 දරන සුරාබදු නිවේදනය

**බෝතල් කරන ලද රා**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය) 22 වැනි වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2016 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි :-

(*අ*) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් රුපියල් තිහක් (රු. 30/-) වන බද්දක් අයවිය යුතු යැයි ද,

එසේ වුව ද, ඉහත කී බෝතල් කරන ලද රා දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද, එකී බද්ද අය නොකළ යුතු යැයි ද,

(*ආ*) 2007 මාර්තු මස 12 වැනි දින අංක 1488/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 896 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01 - 731

1A - PG 2763 — 506 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*